**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 01 – 2021**

-------------------------------------------------------------------------

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන- අදියර 01 හි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2015 සැප්තැම්බර් 17 වන දින එළඹි ණය ගිවිසුම් අංක 3267 – (එස්ආර්අයි) හි 4.06(අ) වගන්තිය හා ණය ගිවිසුම් අංක 3268 – (එස්එෆ්) හි 4.03(අ) වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාල සීමාව

---------------------------------------------------------------------------------

වැඩසටහනේ ණය ගිවිසුම අනුව, වාරිමාර්ග අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. වැඩසටහන ක්‍රියාත්මක කරන ප්‍රදේශයේ කෘෂිකාර්මික හා පානීය ජල අවශ්‍යතා සඳහා ජල සම්පත්වලට ප්‍රවේශවීම තහවුරු කිරීම වැඩසටහනේ අරමුණ වේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහනෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 190කට සමාන රුපියල් මිලියන 28,713ක් වූ අතර, ඉන් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 150කට සමාන රුපියල් මිලියන 22,668ක් ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යායනය කිරීමට එකඟත්වය පළ කර ඇත. රුපියල් මිලියන 6,045ක ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යායනය කිරීමට අපේක්ෂා කර ඇත. මෙම වැඩසටහනෙහි කටයුතු 2015 ජූනි 24 දින ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් 31 දින වන විට එය නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේවුවද, මෙම වැඩසටහනෙහි කාර්යයන් සම්පූර්ණ කරන දිනය 2024 ජූනි 30 දක්වා කාලය දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

------

වැඩසටහනෙහි මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනෙහි මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

--------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. භෞතික කාර්යසාධනය

## 2.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ප්‍රධාන සංරචක 03ක් යටතේ වැඩසටහනෙහි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කළ අතර කාර්යයන්වල භෞතික ප්‍රගතිය පහත විස්තර කර ඇත.

| | සංරචක | 2021 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණ | බලපෑම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | ළඟාකර ගත් කාර්යසාධනය ප්‍රතිශතය | | | |
| (අ) | ඉහළ ඇලහැර ඇල ඉදිකිරීම | 22 | 19 | කොන්ත්‍රාත්කරු විසින් තාවකාලිකව වැඩ නතර කිරීම හේතුවෙන් අපේක්ෂිත | ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල අනපේක්ෂිත ප්‍රමාදයන්. එය අතිරේක | කොන්ත්‍රාත්තුව යටතේ පවතින ක්‍රියාකාරකම්වල ප්‍රමාදයන් සහිතව ආරම්භ කිරීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | භෞතික ප්‍රගතිය ළඟාකර ගත නොහැකි විය. | අරමුදල් අවශ්‍යතා ඇතිකරනු ඇත. තවද, එය කෘෂිකාර්මික කටයුතු සඳහා ද බලපෑමක් ඇති කළ හැක. | සහ කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් මුදල් ප්‍රවාහ සහ ශ්‍රමික හිඟයන් ඇතිවීම |
| (ආ) | වයඹ පළාත් ඇළ ඉදිකිරීම | 46 | 30 | කොන්ත්‍රාත්තුවක් ප්‍රදානයේ ප්‍රමාදයන් සහ 2016 සහ 2018 දී පිරිනමන ලද අනෙක් කොන්ත්‍රාත් 02 හි වැඩවල මන්දගාමී ප්‍රගතිය | සම්බන්ධිත පාර්ශවයන්ට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම | වැඩ සැළසුම්කරණයේ දුර්වලතා සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු නිසා |
| (ඇ) | මිනිපේ වම් ඉවුර ඇල ප්‍රතිසංස්කරණය | 100 | 87 | 2018 දී ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවේ මන්දගාමී ප්‍රගතිය | සම්බන්ධිත පාර්ශවයන්ට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම | සිවිල් ඉදිකිරීම් වැඩ සැළසුම්කරණයේ පැවති දුර්වලතා නිසා |

**කළමනාකරණයේ අදහස් දැක්වීම**

විචලනයට ප්‍රධාන හේතුව වූයේ විවිධ වර්ගයේ කොවිඩ් 19 රැළි බොහොමයක් වන අතර ඉංජිනේරුවරයාට හා සේවායෝජකයාට ඔවුන්ගේ සංචලනයන් සීමා කිරීමට බල කෙරෙනු ඇති අතර වැඩ සීමා විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඉදිකිරීම් වැඩවල කාර්යක්ෂමතාවය දැඩි ලෙස පහත වැටී ඇත්තේ ශ්‍රී ලංකා හා ලෝක වෙළඳපොලවල් දෙකෙහිම ලෝහ, සිමෙන්ති යනාදී අමුද්‍රව්‍යවල විශාල හිඟයක් පැවතීම නිසාවෙනි. තවද, සැළසුම්ගත පරිදි වැඩ ඉටු කිරීමට ඔවුන් හට නොහැකිවීම හේතුවෙන් බොහොමයක් විදේශ කොන්ත්‍රාත්කරුවන් දැඩි මුදල් ප්‍රවාහ හිඟයකට මුහුණ පා ඇති බව හඳුනාගන්නා ලදී. එබැවින්, මුදල් ප්‍රවාහ හිඟයන් සහ ශ්‍රම හිඟයන් වැඩවල ප්‍රගතිය සඳහා බාධා වී ඇත.

**විගණකගේ නිර්දේශය**

වැඩසටහන විසින් නියම කර ඇති කාල සීමාව තුළ පිරිවැය සඵලදායී ලෙස කාර්යයන් නිම කිරීමට හැකිවන පරිදි කොන්ත්‍රාත් පැකේජය යටතේ නිම කිරීමට ඇති සිවිල් ඉදිකිරීම් වැඩ සමීපව නියාමනය කිරීම අවශ්‍යවේ.

**2.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන ගැටළු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වයඹ පළාත් ඇළ ඉදිකිරීම යටතේ නාබදගහවත්ත සිට මහකිතුල ජලාශ ඇතුළු උමග දක්වා වන ප්‍රධාන ඇල 2021 මැයි 06 දිනට නිම කිරීමට අපේක්ෂා කර ඇත. 2021 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය ළඟා කරගෙන තිබුණේ සියයට 62ක් පමණි. 2022 සැප්තැම්බර් 24 දක්වා කාල දිගුවක් ලබා දී ඇත. | ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන් සහ විශේෂයෙන්ම 2018 වර්ෂයේ සිට අභියාචනා මණ්ඩල නඩු 10ක් පැවතීම හේතුවෙන් ඉදිකිරීම් වැඩ දිගටම කරගෙන යාමට කොන්ත්‍රාත්කරුහට නොහැකි වී ඇත. | කොන්ත්‍රාත් විචලනයන් අවම කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | කිලෝමීටර් 0+100 සිට 3+860 දක්වා ඉහළ ඇලහැර ඇළ ඉදිකිරීම 2020 ජනවාරි 08 දින නිම කළ යුතුවේ. අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 100ක් විය. කෙසේවුවද, 2021 දෙසැම්බර් 31 දිනට සත්‍ය ප්‍රගතිය සියයට 64ක් පමණක් විය. දුර්වල ප්‍රගතිය හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2021 ජූනි 07 දින නවතා දමා ඇත. රුපියල් මිලියන 608ක් වටිනා කාර්යසාධන හා ජංගමගතවීම සඳහා අත්තිකාරම් වෙනුවට බැංකු බැඳුම්කර ඇවර කිරීම වැළැක්වීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් කොළඹ දිසා අධිකරණයේ වාරණ නියෝගයක් ගොනු කර තිබුණි. | මෙම ගැටළුව නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර වාණිජ මහාධිකරණයේ තීන්දුවට එරෙහිව නීතිපති දෙපාර්තමේන්තුව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනයක් ඉදිරිපත් කර ඇත. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු විභාග කෙරෙමින් පවතී. | කොන්ත්‍රාත් විචලනයන් අවම කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | මිනිපේ වම් ඉවුරු ඇළ ප්‍රතිසංස්කරණ ඉදිකිරීම් යටතේ ජල පාලනය හා මිනුම් පහසුකම් ඇතුළු මිනිපේ අමුණ උස්කිරීමේ කොන්ත්‍රාත් කාලසීමාව 2020 නොවැම්බර් 12 වන දිනෙන් අවසන් විය යුතු වේ. කොන්ත්‍රාත් කාලසීමාව තුළ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වීම හේතුවෙන් කොන්ත්‍රාත් කාලසීමාව 2021 මැයි 21 දින දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේවුවද, ඉදිකිරීම් වැඩ දිගු කළ කාලසීමාව තුළ අවසන් කර නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට සත්‍ය භෞතික ප්‍රගතිය සියයට 73ක් පමණක් විය. | සමහර වැඩබිම් කාර්ය මණ්ඩල හා සේවකයින් කොවිඩ් 19 පරීක්ෂාවෙන් ධන වීම සහ උච්ච කාලසීමාව තුළ පැනවූ සීමාවන්, වැඩබිමට අමුද්‍රව්‍ය සැපයීමේ දුෂ්කරතාවන්ට ද හේතුවිය. | ඉදිකිරීම් වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පද්ධති කාර්යක්ෂමතා සහ ජල ඵලදායිතා වැඩිදියුණු කිරීමේ උපදේශන සේවා 2015 - 2017 දක්වා ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබූ අතර, එය 2021 දෙසැම්බර් 18 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේවෙතත්, 2022 මාර්තු වන විටත් වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | මේවන විට සමාලෝචනය කරමින් පවතින අවසන් වාර්තාව 2020 මැයි 24 දින ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත භාරදී ඇත. | ප්‍රමාදයකින් තොරව අදාළ කාලසීමාව අනුව උපදේශන සේවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2021 දෙසැම්බර් 31 වනවිට ඉහළ ඇලහැර ඇල ව්‍යාපෘතියට අදාළව ඉඩම් කැබලි 741ක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කළද, කිසිදු ඉඩම් කැබැල්ලක් 2021 දෙසැම්බර් 31 දිනට අත්පත් කරගෙන නොතිබුණි. තවද, වයඹ ඇළ ව්‍යාපෘතියට අදාළව ඉඩම් කැබලි 961ක් අත්පත් කරගැනීමට අපේක්ෂා කර තිබූ අතර, ඉඩම් කැබලි 947ක් 2021 දෙසැම්බර් 31 වන විට අත්පත කරගෙන තිබුණි. කෙසේවුවද, 2021 දෙසැම්බර් 31 දිනට කිසිදු ඉඩම් කැබැල්ලක් ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ලියාපදිංචි කර නොතිබුණි. | රට තුළ 2020 සහ 2021 වර්ෂවලදී වූ කොවිඩ් 19 වසංගත තත්ත්වයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලැබූ සෞඛ්‍ය උපදෙස්වලට අනුකූල වෙමින් සංචලනය සීමාවීම හා සීමිත ප්‍රදේශයක් තුළ වැඩ කිරීම සීමා කිරීම හේතුවෙන් ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද කිරීමේ විවිධ බාධාවන්ට මුහුණපෑමට සිදුවිය. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාකාරකම් කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2021 ප්‍රසම්පාදන සැලැස්මට අනුව අලින් සඳහා රේඩියෝ කරපටි 60ක් මිලදී ගැනීම සඳහා 2021 ජූලි 20 දින ගිවිසුම් අත්සන් තැබීමට සැළසුම් කර රුපියල් මිලියන 64.8ක් වෙන්කර තිබුණද, 2022 මැයි මස වන විටත් තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීමට කටයුතු සිදු කරමින් පැවතුණි. | වනජීවී දෙපාර්තමේන්තුවේ විශේෂඥයින්ගෙන් ලංසු ලේඛන අවසන් කිරීමේ ප්‍රමාදයට හේතු වූ බාහිර යෙදවුම් සෙවිය යුතුවේ. ලේඛනය අවසන් වූ විට, 2022 මැයි තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කරන ලදී. | ප්‍රමාදයකින් තොරව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. |